# ප්‍රසම්පාදන දැන්වීම

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## සැපයුම් සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන්/ආනයනකරුවන්/කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලංසු කැඳවීම
## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - 2024 වසර

1. 2024 වර්ෂය තුල ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පහත සඳහන් විෂයන් මිළදී ගැනීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු සඳහා යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මිළගණන් කැඳවනු ලැබේ.

   අ. තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් අදාල භාණ්ඩ වර්ගය යුද්ධ හමුදා මූලික යුධොපකරණ ගබඩාව රාගම හෝ 1 රෙජි ශ්‍රීලයුයුබ පනාගොඩ වෙත ප්‍රවාහනය කර භාරදිය යුතුය.

   ආ. මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් වැඩකරන දිනවලදී උදේ 1000 පැයේ සිට සවස 1500 පැය දක්වා අයිතමය ඉහලින් දක්වා ඇති දිනයන් තුල ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි යුධොපකරණ සේවා අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් (යුද්ධ හමුදා රථ වාහන ගාල්කරනු ලබන ස්ථානයේදි) ඒකී ලංසු ලබාගත හැකි අතර ටෙන්ඩර් අංකය වෙනුවෙන් දක්වා ඇති ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ මුදල්, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර වෙත මුදලින් ගෙවිය යුතුය. අයදුම්කරුවන් විසින් නිසි පරිදි අත්සන් කරන ලද ලංසුව නිල මුද්‍රාව තැබීමෙන් පසු ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් අඩංගු ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ 2024 වසර (භාණ්ඩ වර්ගය) සඳහා මිල ඉදිරිපත් කිරීම ටෙන්ඩර් අංකය (යුසේඅම/2024/........) දිනය සහ මිළ ගණන් විවෘත කරනු ලබන වේලාව සලකුණු කළ යුතුය.

| මිල ගණන්පත් නිකුත්කරනු ලබන දිනයන් 2024.07.09 - 2024.07.30<br>ලංසු වැසිම හා විවෘත කරනු ලබන දිනය හා වේලාව 2024.07.31 දින පෙ.ව 1100 පැය | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | ටෙන්ඩර් හඳුනාගැනිමේ අංකය | විස්තරය | දේශිය/විදේශිය | ප්‍රමාණය | ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තු මුදල රු: |
| | | වාහන | | | |
| 1 | යුසේඅම/2024/5620 | Tractor 4x4 (without Trailer) | දේශිය | 2 ගණනින් | 3,500.00 |
| | | මුද්‍රණ යන්ත්‍ර | | | |
| 2 | යුසේඅම/2024/5344 | ID Card Printer | දේශිය | 1 ගණනින් | 1,000.00 |
| | | ආබාධිත අයවළුන්ගේ විශේෂිත උපකරණ | | | |
| 3 | යුසේඅම/2024/5503 | Endolite M/Flex Foot For P & O Workshop | දේශිය | 19 ජෝ/වි | 3,500.00 |
| 4 | යුසේඅම/2024/5509 | Materials For P & O Workshop | දේශිය | 44 ජෝ/වි | 1,000.00 |
| 5 | යුසේඅම/2024/5513 | Stockinette For P & O Workshop | දේශිය | 10 ජෝ/වි | 1,000.00 |

2. ලංසු තැබීම දක්වා ඇති පරිදි ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිය හරහා සිදුකෙරේ.

3. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකක් ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට හෝ එම ලිපිනයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ලංසු වැසීමේ කාලය අවසන් වීමට පෙර තැම්පත් කළ හැකිය. අදාළ භාරගැනීම් කාලය අවසන් වූ වහාම ලංසු විවෘත වන අතර ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ජාතික හැඳුනුම්පත හා සේවා ස්ථානයේ ලිපියක් සමග ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකු හට ලංසු විවෘත කිරීම සඳහා සහභාගිවිය හැකිය.

**ප්‍රසම්පාදන කමිටු සභාපති**
**යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටුව**
**යුධොපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව**
**යුද්ධ හමුදා මූලස්ථානය**
**ශ්‍රී ජයවර්ධනපුර**
**කොළඹ**

4. ලංසු ඉදිරිපත් කිරීම සඳහා සැපයුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය. කාර්මික ඇගයීම් අවස්ථාවේදී අදාළ සුදුසුකම් සලකා බලනු ලැබේ.
   අ. මූල්‍ය හැකියාව.
   ආ. සතුටුදායක බදු ගෙවීමේ වාර්ථාව
   ඇ. ප්‍රමාණවත් නිෂ්පාදන හැකියාව
   ඈ. ප්‍රමාණවත් ගබඩා පහසුකම්
   ඉ. ප්‍රමාණවත් කායීමණ්ඩල නිලධාරීන් හා කායීාල පහසුකම්
   ඊ. ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම්
   උ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පිටපතක් හෝ පසුගිය වසර තුනක මෙහෙයුම්වාර්ථාව සමග සංස්ථා සහතිකයක්

5. දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වැට් බදු සඳහා ලියාපදිංචි වි ඇති ලංසුකරුවන් මිල කැඳවිමේ නිවේදනය සමග වැට් බදු සඳහා ලියාපදිංචි වි ඇති සහතිකය ඉදිරිපත්කල යුතුය.

6. අසම්පූර්ණ හා අවශ්‍ය ලේඛණ සාක්ෂි සමග නොමැති ලංසු ලේඛණ ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති හට ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමටත් මිළදීගනු ලබන ප්‍රමාණයන් තීරණය කිරීමටත් අයිතියක් ඇත.

7. ගිවිසුම් අත්සන් කිරීම සඳහා තෝරාගත් ලංසුකරුවන් හට ලියාපදිංචි තැපැලෙන් දැනුම්දෙනු ලැබේ.

8. සැපයුම්කරුවන් සඳහා ජේෂණපත් මගින් ගෙවීම් සිදුකරනු ලබයි.

9. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවැසි වැඩි විස්තර ලබාගැනීම සඳහා දුරකථන අංක 011 - 2987534 හා 011 - 2987537 අංශ භාර නිලධාරි වෙතින් ලබාගත හැකිය.

**යුද්ධ හමුදාධිපති**
**යුද්ධ හමුදා මූලස්ථානය**
**ශ්‍රී ජයවර්ධනපුර**
**කොළඹ**